# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2015

### 2021 මාර්තු - ජූනි

### මානව ශාස්ත්‍ර පීඨය

### බෞද්ධ දර්ශනය

**බෞද්ධ සමාජ දර්ශනය, පාරභෞතික ප්‍රස්තුත හා සමයාන්තර චින්තා BUPH – E 2025**

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

1. ජන්මීය සාධක පදනම්කොටගෙන මානව සමාජය වර්ගීකරණය කිරීමේ නිසරුබව තහවුරු කිරීමට බුදුසමය ඉදිරිපත් කරන සාධක මූලාශ්‍රයානුසාරයෙන් පෙන්වා දෙන්න.

2. ධනෝපායනය හා ධනපරිභෝජනය පිළිබඳ බෞද්ධ විවරණය සමාජ සහජීවනයට ඉවහල්වන අයුරු අදාළ සූත්‍රදේශනා ඇසුරෙන් පැහැදිලි කරන්න.

3. බෞද්ධ දේශපාලන මූලධර්ම සමාජ ශුභසාධනවාදී රාජ්‍යපාලන ක්‍රමයක් ඉලක්කකර ඇද්දැයි අදාළ මූලාශ්‍රය නයින් පරීක්ෂා කරන්න.

4. සමාජ සංවිධානයක යහපැවැත්ම පිණිස සියලු සාමාජිකයන් සිය යුතුකම් හා වගකීම් නොපිරිහෙළා ඉටුකිරීමට ඉවහල්වන ආකාරය අදාළ සාධක මගින් පෙන්වා දෙන්න.

5. නීතිය, වරද හා දඬුවම පිළිබඳ බුදුසමයේ ස්ථාවරය ශාසනික නීති රීති හා සූත්‍රදේශනාගත ඉගැන්වීම් අනුසාරයෙන් පැහැදිලි කරන්න.

6. නූතන සමාජ ප්‍රශ්න විසඳීමෙහි ලා බෞද්ධ ඉගැන්වීම් කෙතෙක් දුරට උපයෝගී කරගත හැකිදැයි ප්‍රකට සමාජ ප්‍රශ්න දෙකක් අනුසාරයෙන් පැහැදිලි කරන්න.

7. දස අව්‍යාකෘත පිළිබඳ බුදුසමයේ ස්ථාවරය මගින් හෙළිවන පාරභෞතික ප්‍රස්තුත විෂයෙහි බුදු සමයේ ආකල්පය ප්‍රකට කරන්න.

8. කර්මය පිළිබඳ බුද්ධකාලීන ආගමික ඉගැන්වීම්වලට සාපේක්ෂව බෞද්ධ ඉගැන්වීම්වල සුවිශේෂතා පෙන්වා දෙන්න.

9. ඊශ්වර නිර්මාණවාදය කෙටියෙන් පැහැදිලි කර, එය බුදුසමයේ විචාරයට ලක්ව ඇති ආකාරය නිදසුන් මගින් පෙන්වා දෙන්න.

10. ආත්මවාදය ඛණ්ඩනය කිරීමෙහි ලා බුදුසමය ඉදිරිපත් කරන සාධක මූලාශ්‍රයානුසාරයෙන් ගෙනහැර දක්වන්න.

***********************************